## *විමල් වීරවංශ  කළ සම්පූර්ණ දේශනය*

සුභ උදෑසනක් මාධ්‍යවේදී ඔබ සියලු දෙනාට! මෙම මාධ්‍ය සාකච්ඡාව ප්‍රධාන කාරණාවක් පිළිබඳව ජාතික නිදහස් පෙරමුණේ අපගේ ස්ථාවරය ඔබ මඟින් මේ රටේ පොදු ජනතාව හමුවට ගෙන යෑම සඳහා අපි පවත්වනු ලබනවා.

වර්තමාන පුනරුද ආණ්ඩුව බලයට පත්වීමට පෙරාතුව මේ රටේ මහජනතාව මත වපුරපු, ඔවුන්ගේ හිස මත වපුරපු ඒ මායාකාරී සිහින කන්දරාව අද ගෙවෙන හැම මොහොතක් පාසාම කුඩුපට්ටම් වෙන්න පටන් අරගෙන තියෙනවා. ඔවුන් මේ රටේ පොදු ජනතාව තුළ තබන ලද බලාපොරොත්තු වලට සම්පූර්ණ පටහැනි, ඊට එරෙහි, ප්‍රතිවිරෝධී ක්‍රියාමාර්ග වලට හිතක් පපුවක් නැතුව, කිසිම තමන් කියපු දේ පිළිබඳ වගකීමක් නැතුව, ලැජ්ජා විරහිත ආකාරයට කරගෙන යන තත්ත්වයක් තමයි අද අපිට අත්විඳින්න සිද්ධ වෙලා තියෙන්නේ.

මේගොල්ලෝ බලයට එනකොට කිව්වේ මේ රටේ විදුලි පාරිභෝගිකයාට දුන්නු බලාපොරොත්තුව තමයි 33%කින් විදුලිය බිල පහළ දැමීමට තමන්ට හැකියාව තියෙනවා කියලා. මේ හොරකම, නාස්තිය නතර කළාම ඒ මඟින් පමණක් 33%කින් විදුලිය පිරිවැය අඩු කරලා විදුලිය බිල අඩු කරන්න පුළුවන් කියලා මේ රටේ පොදු ජනතාවට බලාපොරොත්තු දුන්නේ අපි නෙවෙයි. අද ජනාධිපති පුටුවේ වාඩි වෙලා ඉන්න අනුර කුමාර දිසානායක. මේ අය මේ හීන පෙන්නලා තමයි තමන්ට නොතිබිච්ච මහජන විශ්වාසයක් ඒ විදිහට රවට්ටලා දිනාගෙන තමයි අද "රජසැප" විඳින්නේ, අද "බලය" භුක්ති විඳින්නේ, අද "ඩබල් පොකට්" හොරකම් වල නියැලෙමින් ඉන්නේ.

දැන් අපි දන්නවා 2025 ජනවාරි 17 වෙනකොට මේ රටේ විදුලි පාරිභෝගිකයා එක විදුලි ඒකකයට ගෙවපු මිල තමයි රුපියල් 24යි සත 20ක්. අද 2026 මැයි වෙනකොට, 2025 ජනවාරි තිබුණු මිල රුපියල් 24යි සත 20ක්, අද 2026 මැයි වෙනකොට ඒ ගණන මේ රටේ පාරිභෝගිකයා මත පටවලා තියෙනවා, වැඩි කරලා තියෙනවා. විදුලිය ඒකකයක මිල රුපියල් 37යි සත 26ක් දක්වා වැඩි කරලා තියෙනවා. ඒක ඒ වර්ධනය, ඒ වැඩිවීමේ අගය 54%ක පමණ වැඩිවීමක් සිද්ධ වෙලා තියෙනවා.

මේ වැඩි කිරීම සිදු වෙන්නේ ඇයි? මේකේ වරද කොහෙද? කුමන හේතු මතද මේ මේසා විශාල... තමුන්වහන්සේලා දන්නවා මීට කලින් ඒකක 180ට වඩා වැඩි විදුලිය පරිභෝජනය කරන අයට මීට කලින් 25%කින්, සිංහල අලුත් අවුරුද්ද ඉවර වෙච්ච ගමන්ම 25%කින් වැඩි කළා. ඊට පස්සේ ඊයේ පෙරේදා නැවත 18%කට වැඩියෙන් වැඩි කළා. එතකොට මේ ආසන්න වශයෙන් 50%ක පමණ වැඩිවීමක් තියෙනවා. මේ 50%ක වැඩිවීමක් මෙහෙම කරන්නේ ඇයි? කොහෙද වරද? මොකක්ද හේතුව? ඒක තමයි අපි මෙතැනදී පළමුවෙන්ම අවධානය යොමු කරන්න ඕනේ.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, මේගොල්ලෝ රණිල් වික්‍රමසිංහ මහත්තයා කරපු මේ පෙළවහ, වික්‍රමසිංහ මහත්තයා දික්කසාද වෙනකොට මේගොල්ලෝ ගිහිල්ලා ඒ මූල්‍ය අරමුදල නෝනා සරණ පාවා ගත්තා. වැන්දඹු කාන්තාවක් අතරමං වෙන්න දෙන්න හොඳ නැහැ, ඒක අපේ යුතුකම නෙවෙයි කියලා මේගොල්ලෝ බොහොම බදාගත්තා. එන්න කලින් කිව්වේ “ඔය කනවැන්දුම් IMF එක අපි බාර ගන්නේ නැහැ, ඕකත් එක්ක ගියොත් හරියගිය රටක් නැහැ, මූසල මාවතකට තමයි රට වැටෙන්නේ” කියලා. නමුත් ආපු ගමන් කරේ “ක්‍රිස්ටලීනාව” බදාගෙන උම්මා දීගෙන තමයි දැන් ඒක වැළඳගත්තේ. ඒ මූල්‍ය අරමුදලෙන් කියලා තියෙනවා පිරිවැය අනුව මිල තීරණය කරන්න කියලා. දැන් මොකද වෙලා තියෙන්නේ? පිරිවැය දවසින් දවස වැඩිවෙලා තියෙනවා. ඇයි වැඩිවෙලා තියෙන්නේ? මොකක්ද හේතුව? ඒක තමයි තේරුම් ගන්න ඕනේ.

මේ ආණ්ඩුව ඇවිල්ලා ටික දවසක් යනකොට “සුනිත්‍ය විදුලි බලය” අධෛර්යයට පත් කරන්න පටන් ගත්තා. ඉරිදාට මේ රටේ සුනිත්‍ය විදුලි බලය නිපදවන ඒ කුඩා පරිමාණ විදුලි නිෂ්පාදනාගාර අයිතිකරුවන්ට කිව්වා "ඉරිදාට වහන්න, අපට බැටරි පද්ධතියක් නැහැ අතිරික්ත විදුලිය ගබඩා කරගන්න" කියලා. ඒ විදිහට සුනිත්‍ය විදුලි බල නිෂ්පාදනය අධෛර්යයට පත් කළා. නොතිබ්ච්ච බදු ගහන්න පටන් ගත්තා සුනිත්‍ය විදුලි බලය නිපදවීමට ගෙනෙන, ආනයනය කරන උපකරණ වලට.

ඒ විතරක් නෙවෙයි, මේ වෙනකොටත් ජාතික විදුලිබල පද්ධතියට තමන් නිපදවන සුනිත්‍ය විදුලි බලය ලබා දී තිබෙන ඒ සුනිත්‍ය විදුලි බල නිෂ්පාදකයන්ට රුපියල් බිලියන 10කට වඩා මුදලක් ගෙවන්නේ නැතුව කල් මරමින් ඉන්නවා විදුලිබල මණ්ඩලය. ඒ මගිනුත් කරන්නේ සුනිත්‍ය විදුලි බලය නිපදවන ඒ පෞද්ගලික අංශයේ නිෂ්පාදකයන්ව අධෛර්යයට පත් කරන එක, ඒ ව්‍යාපාරයෙන් පලවා හැරීම. මෙහෙම කරලා පිරිවැය අඩු විදුලිය ජනනය කරන ක්‍රම වලට ප්‍රමුඛත්වය දෙනවා වෙනුවට, ඒවා අධෛර්යයට පත් කරලා, ඒවාට නොතිබුණු බදු අය කරලා, ඒවා නිපදවන මිනිස්සුන්ට ගෙවන ගෙවීම් ප්‍රමාද කරලා තවදුරටත් කරන්නේ පොසිල ඉන්ධන මාෆියාවේ බඩ කට පුරවන එක, ඒ මඟින් තමන්ගේ ඩබල් පොකට් එක පුරවා ගන්න එක. ඒක තමයි ප්‍රධාන හේතුව.

අනිත් එක තමයි මේ රටේ බාල ගල්අඟුරු ගෙනල්ලා ඒ බාල ගල්අඟුරු වලින් නියමිත විදුලි ඒකක නිපදවා ගන්න බැරි වෙලා, ඒ බැරි වෙච්ච ප්‍රමාණය නිපදවන්න ඩීසල් අධික මිලට අරගෙන ඒ ඩීසල් වලින් විදුලිය නිපදවන්න ගියාම පිරිවැය වැඩි වෙන එක වළක්වන්න බැහැ. බාල ගල්අඟුරු ගේන බාල සමාගම තෝරාගත්තේ කවුද? බාල ගල්අඟුරු ගෙනත් දීලා දැන් අද ගණන් හදාගෙන ඉන්නවා නොරොච්චෝල බලාගාරය ගිය මොහොතේ. එක නැවක් බාන්න දවස් හයක් හතක් යනවා වාරකම් වෙලාවේ. නැවෙන් 20%ක් පමණ මුහුදට වැටෙනවා. නැව් පහක් බෑවොත් එක නැවක් මුහුදේ.

ඒ නැව් ටික බානකල් අනිත් නැව් ටික තියාගෙන ඉන්නවා, ප්‍රමාද ගාස්තු ගෙවනවා ඇමෙරිකානු ඩොලර් වලින්. මේ කාගේ සල්ලිද? 'ඩබල් පොකට්' ගමෙන් ගෙනාපු සල්ලිද? තමුන්ගේ ගමින් අරන් ආපු සල්ලිද? මේ රටේ විදේශගත ශ්‍රමිකයා ශ්‍රමය වගුරුවලා එවන කීය හරි විදේශ විනිමය ටිකෙන් මුන්දැලා අද මේ මරිමෝඩ තකතීරු තීරණ අරගෙන තමන්ගේ පොකට් දෙක පුරවා ගැනීමේ කෑදර පෙරේතකමින් ගත්තු තීරණ හන්දා මේ රටේ විදුලි පාරිභෝගිකයා දුක් විඳිනවා විතරක් නෙවෙයි, විදේශගත ශ්‍රමිකයා බොහොම අමාරුවෙන් දුක් විඳලා එවන විදේශ ප්‍රේෂණ ටික ඒ ඔක්කොම ටික අද ඒ හොරා කෑමේ ගොදුරක් බවට පත් කරලා තියෙනවා.

ඔබට හොයලා බලන්න පුළුවන් මාධ්‍යවේදීන් විදිහට නොරොච්චෝල බලාගාරයට අද එක නැවක් මේ වාරකම් සමයේ එක නැවකින් ගල්අඟුරු ටික බාන්න යනවා දවස් හය හතක්. ඒකෙනුත් 20%ක් විතර මුහුදට වැටෙනවා. නැව් පිටින් බලාගෙන ඉන්නවා තමන්ගේ වාරය එනකන්. තාම ඇවිල්ලා තියෙන්නේ අර මුල් ටෙන්ඩරෙන් නැව්... වැඩි වුණොත් තාම ඇවිල්ලා තියෙන්නේ 16ක් පමණයි. මේ ඔක්කොම වැරදි තීරණ වල ප්‍රතිඵල. ඒ නිසා තමයි අධික මිලට ඩීසල් වලින් විදුලිය නිපදවන්න වුණේ. ඒ නිසා තමයි විදුලිබල මණ්ඩලයේ බිලියන 30 ගණනක පාඩුවක් ගැන කියන්නේ. මෙහෙම මරිමෝඩ තකතීරු තීරණ අරගෙන ඒ වැරදි තීරණවල හොරා කන්න බලාගෙන ගත්තු තීරණ වල බර අද මේ රටේ මධ්‍යම පන්තිය ඇතුළු සකල ජනයා මත පටවමින් ඉන්නවා.

දැන් බලන්න තමුන්වහන්සේලා මේ.... ඒ විතරක් නෙමෙයි, එදා ත්‍රිකුණාමලයේ හදන්න ගිය ‘‘සාම්පූර්’’ විදුලි බලාගාරය නතර කළේ කවුද? ඒකට විරුද්ධව උද්ඝෝෂණ කළේ කවුද? 'ඩබල් පොකට්' ලා නෙවෙයිද? සාම්පූර් විදුලි බලාගාරයට විරුද්ධව උසාවි ගියේ 'ඩබල් පොකට්' ලා නෙමෙයිද? එදා උසාවි ගිහිල්ලා ඒක නවත්තලා ඒකම කරපු 'ඩබල් පොකට්' ලා දෙවි හාමුදුරුවනේ, ලැජ්ජාවක් ගැවිලාවත් නැතුව ඉන්දීය අග්‍රාමාත්‍ය මෝඩි ලංකාවට ආපු වෙලාවේ ඩිජිටල් ක්‍රමයට සාම්පූර් බලාගාරයට නැවත මුල්ගල් තිබ්බේ නැද්ද?

තමන්ම උසාවි ගිහිල්ලා, තමන්ම පෙළපාළි ගිහිල්ලා, තමන්ම බොරු කියලා, තමන්ම විරෝධතා පවත්වලා නතර කරපු සාම්පූර් එකට දෛවයේ සරදමට තමන්ම බලයට ඇවිල්ලා තමන්ගේම ඇඟිල්ලෙන් මෝඩි අගමැතිත් එක්ක ඔබනවා, ඩිජිටල් මුල්ගල තියෙනවා ඇඟිල්ලෙන් ඔබ ඔබ. මෙන්න ' ඩබල් පොකට්' ලගේ කෙරුවාව! එදා ඒ බලාගාරය හදන්න දුන්නේ නැත්තේ මේගොල්ලෝ. ඒවා හැදුවා නම් අධික මිලට ඩීසල් වලින් විදුලිය නිපදවන්න ඕන වෙන්නේ නැහැ. අදත් විදුලිය පිරිවැය අඩු කරන්න තියෙන තීරණ ගන්නේ නැහැ. මේ ඔක්කොම අද මහජනයාට මේ කරුමයට කරගහන්න කියලා තමයි මුන්දලා අද සැපට සැපේ බලාගෙන ඉන්නේ.

ආණ්ඩුවේ හොරකමේ බර, බැරිකමේ බර මේ රටේ ජනතාවට අද කරගහන්න කියලා තමයි මේගොල්ලෝ කියන්නේ. ආණ්ඩුවේ හොරකමේ බරයි, බැරිකමේ බරයි, නොහැකියාවේ බරයි මේ ඔක්කෝටම වන්දි ගෙවන්න සිද්ධ වෙලා තියෙන්නේ මේ රටේ මධ්‍යම පාන්තික ජනතාව ඇතුළු සමස්ත අහිංසක පොදු ජනතාවට.

අද මේ වැඩි කරලා තියෙන විදුලිය බිල හැටියට ඒකක 180ට උඩින් තියෙනවා මේ රටේ සෑම ව්‍යාපාරයක්ම පාහේ. සෑම ආයතනයකම විදුලි බිල ඒකක 180ට වැඩියි. ශීතකරණයක්, විදුලි පංකාවක් වැඩ කරනවා නම් ගෙදරක, ආයතනයක වායු සමීකරණ යන්ත්‍රයක් වැඩ කරනවා නම් ඒකක 180ට වැඩියි. මේ රටේ කමර්ාන්ත වහන්න වෙනවා.

මුද්‍රණ කමර්ාන්තය වෙන්න පුළුවන්, වෙනත් කමර්ාන්ත වෙන්නම පුළුවන්. මේවායේ නිෂ්පාදන ක්‍රියාවලීන් බිඳ වැටෙනවා. පිරිවැය ඉහළ යනකොට ගාස්තු අය කිරීම වැඩි වෙනවා. මිනිස්සු අතේ සල්ලි නැහැ, ව්‍යාපාර වැහෙනවා. ඒ අස්සේ කොරේ පිටට මරේ කියන්නා වගේ "රුපියල දවසින් දවස අශ්ව වේගයෙන් කඩා වැටිමින්" පවතිනවා. රුපියල බලා කියාගන්නවත් අද මොකෙක්වත් ඇත්තේ නැහැ. රුපියල බලාගන්න මහ බැංකුවේ ඉන්නේ, උන්දලාට ලක්ෂ ගණනින් පඩි ගෙවන්නේ. ඒකේ පියන්ටත් ලක්ෂයට වඩා වැඩියි පඩිය, රියදුරාටත් ලක්ෂ ගණනක් පඩිය, අධිපතිට ලක්ෂ සිය ගණනින් පඩිය. එච්චර පඩි ගෙවා ගෙවා මේ උන්දලාව නඩත්තු කරන්නේ මොකටද? රුපියල බලාගන්න, මූල්‍ය පාලනය තියාගන්න.

NDB බැංකුවෙන් රුපියල් බිලියන 13ක් හොරකම් කරනවා, මහ බැංකුවේ උන්දලා බබාලා. ඩොලර් මිලියන 2.5ක් වැරදි ගිණුමකට දානවා, වාර හතක්ම දානවා, මහ බැංකුව යටතේ වගකීම තියෙනකොට වගේ වගක් නැතුව ඉන්නවා. දැන් අධිපතියාව හොයාගන්නත් නැහැ නන්දලාල්ව, උන්දැ ගියාම ගියාමයි... ජේන තෙක් මානයක ඇත්තේ නැහැ. රුපියල කඩාගෙන වැටෙනවා අශ්ව වේගයෙන්.

තමුන්නාන්සේලා දන්නවා එදා මේ පහුගිය මාස හතරට විතරක්, පහුගිය මාස හතරට විතරක් 2.9%ක වේගයෙන් රුපියල කඩාගෙන වැටුණා. ඒ කියන්නේ අපි දන්නවා රනිල් වික්‍රමසිංහ තමන්ගේ මිත්‍ර අනුර කුමාර මහත්මයාට මේ රට භාර දීලා යනකොට රුපියලේ අගය තිබුණේ 293යි. දැන් ඒක 325ටත් එහාට ගිහිල්ලා. දැන් මේ වෙච්ච වෙනස, 293 ඉඳලා 325 දක්වා මේ වෙච්ච අවප්‍රමාණය වීම නිසා පමණක්, ඒ හේතුව නිසා පමණක් ලංකාවේ ණය බර වැඩිවෙලා තියෙනවා රුපියල් බිලියන 1,257කින්. ඒ හේතුව නිසා පමණක්! තනි පුද්ගලයෙකුට වැටෙන ණය ගැන කියමින්, ඒ ණය බර ඇති කරපු විදිය ගැන කියමින්, අවුරුදු 76ක පාලකයන්ට දෙස් දෙවොල් තබමින් නරිවාදන් දොඩපු 'ඩබල් පොකට්' මහත්තුරු අද රුපියලට ඕන දෙයක් වෙච්චදාවේ කියලා අහක බලාගෙන ඉන්නවා. ඒ නිසා විතරක් රුපියල් බිලියන 1,257කින් ණය බර ඉහළ ගිහිල්ලා තියෙනවා.

මේ අතිරේක බර කොහෙන්ද එකතු කරන්නේ? ඒ අතිරේක වන රුපියල් බිලියන 1,257ක් කොහෙන්ද එකතු කරන්නේ? මේක එකතු කරන්නෙත් ආයේ මහජනයාට බදු පිට බදු ගහලා, මහජනයා මත බදු පිට බදු පටවලා තමයි මේක එකතු කරන්නේ. වෙන ක්‍රමයක් මේගොල්ලොන්ට ඇත්තේ නැහැ. මධ්‍යම පන්තිය අද ‘‘බොටුව’’ මිරිකනවා. කාන්තාවෝ ගියේ "එක මිටට" අඩු මිලට ජීවත් වෙන්න පුළුවන් මාවතක් පාදලා දෙයි කියලා හිතාගෙන. දැන් "එක මිටට" කාන්තාවන්ගේ උගුරු දණ්ඩ මිරිකනවා. ආණ්ඩුවේ හොරකමේ, බැරිකමේ වසුරු මේ රටේ පොදු ජනතාවගේ හිස මත පතිත කරමින් ඉන්නවා.

ඒ නිසා මූල්‍ය අරමුදල කියන පදයට නටන්න තඹුත්තේගම ‘‘ඩබල් පොකට්’’ නැට්ටුවා ඕන නෑ, මූල්‍ය අරමුදල කියන පදයට නටන්න මල් පාරේ රනිල් ඊට වඩා හොඳට දන්නවා. මූල්‍ය අරමුදල කියන පදයට නටන්න මල් පාරේ 'ටයිකෝට්' නැට්ටුවාට තරම් තඹුත්තේගම ‘‘ඩබල් පොකට්’’ නැට්ටුවාට පුළුවන් කමක් නැහැ. ඒ නිසා 'ඩබල් පොකට්' නැට්ටුවාට මේ රට බාර දුන්නේ මූල්‍ය අරමුදල කියන පදයට නටන්න නෙවෙයි, මල් පාරේ 'ටයිකෝට්' නැට්ටුවා නටපු නැටිල්ල නටන්න නෙවෙයි, ඒකවත් නටාගන්න බැරි විදිහට අඩිය තියන්න නෙවෙයි.

ඒ නිසා මේ කරන අපරාධය අද ආණ්ඩුවටම පිළිගන්න වෙලානේ. දැන් උද්දච්ච ආණ්ඩුව කියනවා "අපිට එන්න තනතුරු දෙන්න විපක්ෂයේ දක්ෂ මහත්තුරුන්ට අපි ආරාධනා කරනවා" ලු. දැන් හාමුදුරුවනේ කලින් කිව්වේ මේක "සුන්බුන් විපක්ෂයක්" කියලා. සුන්බුන් විපක්ෂය කොහෙද හාමුදුරුවනේ? ඊට පස්සේ කිව්වේ මේක "වල් පැළ" කියලා, "වල් පැළ ගලවලා මල් පැළ වැව්වා" කියලා කිව්වා. දැන් මල් පැළ වලින් හදපු ආණ්ඩුව වල් පැළ අතරේ හොයනවා දක්ෂ මහත්තුරු ගන්න. දක්ෂ වල් පැළ හොයනවා. දැන් මොකක්ද අපිට මේකෙන් පේන්නේ?

අද තියෙන්නේ බුන්වත් වෙච්ච ආණ්ඩුවක්. බුන්වත් වෙච්ච ආණ්ඩුව සුන්බුන් විපක්ෂයෙන් හොයනවා දක්ෂයෝ එන්න අපි තනතුරු දෙන්නම් කියලා. අන්න එතැනටම ආණ්ඩුව හතරගාතයෙන් වැටිලා ඉවරයි. බුන්වත් ආණ්ඩුව තමන් සුන්බුන් විපක්ෂය කියලා කියපු ඒ සුන්බුන් විපක්ෂයේ සුන්බුන් වලට ආරාධනා කරනවා "එන්න අනේ තනතුරු ගන්න, අපට මේක කරගන්න විදියක් නැහැ" කියලා. ඒක තමයි මේකෙන් කියන්නේ.

ඒ නිසා අපි කියනවා බුන්වත් ආණ්ඩුවට, රටත් බුන්වත් කරලා පාලනයත් බුන්වත් කරගෙන මුළු රටම සුන්නත්දූලි කරන්නේ නැතුව තමන්ගේ බැරිකම දැන් වක්‍රමානයෙන් පිළිගෙන තියෙනවා. ඒ නිසා තමයි සුන්බුන් විපක්ෂයේ තනතුරු ගන්න එන්න කියලා කියන්නේ ඕගොල්ලෝ කියන සුන්බුන් විපක්ෂයට. බුන්වත් ආණ්ඩුව. ඒ නිසා අපි ඉතා ඕනෑකමින් ඉල්ලනවා මහජනතාවගෙන්, මේ රට මේ වැටී තිබෙන ආර්ථික අගාධයේ පතුල හාර හාර යන ගමනක මේ යන්නේ. එයින් ගොඩගන්නා ගමනක නෙවෙයි. ඒ

නිසා 'ඩබල් පොකට්' හොරුන්ට බැහැ මේ රට මේ වැටී තිබෙන ප්‍රපාතයෙන් ගොඩගන්න. ඒ නිසා අපි මේ රටේ පොදු ජනතාවට කියනවා මේ තමන් මත පටවන දැවැන්ත බරට, ජීවන බරට, බදු බරට ඒ වගේම වැය බරට එරෙහිව පාරට බහින්න සූදානම් වෙන්න. මේ ආණ්ඩුව පන්නා හරින තෙක්, මේ බූන්වත් ආණ්ඩුව එලවා දමන තෙක් ඒ සටන ජයග්‍රාහීව ඉදිරියට ගෙන යන්න සූදානම් වෙන්න කියන ආරාධනාව අපි මේ රටේ පොදු ජනතාවට ඉදිරිපත් කරනවා.

***මාධ්‍යවේදියෙකුගේ ප්‍රශ්නය:***

දැන් ජනාධිපතිතුමා මහින්ද රාජපක්ෂ මහත්මයාව අල්ලස් කොමිසමට කැඳවා තිබෙනවා. ඔබ දකින්නේ මේක සාමාන්‍යයෙන් නීති ක්‍රියාවලියක් විදිහටද නැත්නම් මේ දේශපාලන පළිගැනීමක් විදිහටද?

***වීරවංශ මහතාගේ පිළිතුර:***

මේක මේගොල්ලෝ කොටි ඩයස්පෝරාවේ සල්ලි වලින් ඡන්දේ කරේ. ඔය පිටරට ගිහිල්ලා රැස්වීම් තියෙනකොට වැඩිපුර වියදම් කරේ කොටි ඩයස්පෝරාවේ කට්ටිය. ඒගොල්ලොන්ව සතුටු කරන්න ඕන. දැන් මේ මැයි මාසේ යුද්ධ ජයග්‍රහණයේ මාසය.

මේගොල්ලෝ ආපු වෙලේ ඉඳන් නාවික හමුදාපතිවරයෙක් හිරේ දැම්මා, නාවික හමුදා බුද්ධි අංශ නිලධාරීන් හිරේ දැම්මා, යුද හමුදා බුද්ධි අංශ නිලධාරීන් හිරේ දැම්මා. ඒ විතරක් නෙමෙයි හිටපු බුද්ධි අංශ ප්‍රධානී, රාජ්‍ය බුද්ධි අංශ ප්‍රධානී සුරේෂ් සලේව හිරේ දාගෙන ඉන්නවා තවමත්, වධ පිට වධ දෙමින්.

දැන් ඒ වෙලාවේ සේනාධිනායකයා හිටපු මහින්ද රාජපක්ෂ මැතිතුමාවත් දැන් අල්ලස් දූෂණ කොමිසමට ගෙනල්ලා අරෙහෙ ඉන්න හිපාටුවන්ව සතුටු කරවනවා. "ඔන්න ඕගොල්ලොන්ගෙන් සල්ලි ගත්තා වගේම අපි ඕගොල්ලොන්ට පොරොන්දු වෙච්ච පරිදි වැඩ ටික කරනවා" කියලා. මේ ආණ්ඩුවට වෙන වැඩක් නැද්ද? මේ බූන්වත් ආණ්ඩුවට කරන්න වැඩ නැද්ද? මහින්ද රාජපක්ෂගේ පහුගිය වත්කම් බැරකම් ටික හොයන එකද මේ බූන්වත් ආණ්ඩුවට තියෙන එකම වැඩේ?

මේක සහමුලින්ම තමන්ගේ හිතවාදීන් පිනවීම සඳහා කරන රංගනයක්. ඒ රංගනය අද මාරාන්තික රංගනයක් වෙලා තියෙනවා, මිනිස්සුන්ගේ ජීවිත බිලිගන්න රංගනයක් බවට පත්වෙලා තියෙනවා. ඒ නිසා අපි කියනවා රංගනයේ නිරත මහත්වරුන්ට, මේ ආණ්ඩුවේ ආයු කාලය වැඩි කාලයක් නැහැ. ඒ නිසා නටපු වැරදි රංගනයට උත්තර බඳින්නත් ලෑස්ති වෙලා ඔය නැටුම් නටන්න කියලා.